<u>ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබද අමාත්‍යාංශය</u>

**<u>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ යාන්ත්‍රික ශිල්පී තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම (සීමිත)</u>**

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ යාන්ත්‍රික ශිල්පී තනතුරේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු දරණ සුදුසුකම් ලබා ඇති සේවකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **2018.09.21** දින හෝ ඊට පෙර ලැබෙන සේ <u>**"අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, පේරාදෙණිය"**</u> යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " <u>**යාන්ත්‍රික ශිල්පී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය (සීමිත)**</u> "යන්න සඳහන් කළ යුතුය.

**01.**තනතුර -: යාන්ත්‍රික ශිල්පී **III** ශ්‍රේණිය.
මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

**02.**මාසික වැටුප් පරිමාණය -: රු.**25,250-10x270-10x300-10 x330- 12 x350 - 38,450/-( PL-2 -2016)**
(වැටුප් ගෙවනු ලබන්නේ ,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **03/2016** උපලේඛණ **II** හි සඳහන් පරිදිය.)

**03.**අධ්‍යාපන සුදුසුකම් -: අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**04.**වෘත්තීය සුදුසුකම් -: තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (**N.V.Q**) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක යාන්ත්‍රික ශිල්පීය කටයුතු පිළිබඳව ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**05.**පළපුරුද්ද -: යාන්ත්‍රික ශිල්පය පිළිබඳ වසර **02**ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.

**06.**කායික සුදුසුකම් -: ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**07.**වෙනත් සුදුසුකම් -:

**i.** සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු **05** ක සේවා කාලයක් සම්පූර්ණකර තනතුරේ ස්ථිරකර තිබිය යුතු අතර තනතුරට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**ii.**අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

**iii.**තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් **2018.09.21** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08.**බඳවා ගැනීමේ ක්‍රමය -: වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත පවත්නා පුරප්පාඩු වලින් **50%** ක් පුරවනු ලැබේ. වෘත්තිය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

★★★වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන්නේ පහත සඳහන් පරිදි වේ.

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I | ක්ෂේත්‍රයට අදාල මූලික දැනුම | 20 | |
| II | උපකරණ සවි කිරීම, අලුත් වැඩියා කිරීම, පිළිබඳ දැනුම | 20 | |
| III | අදාල ක්ෂේත්‍රයේ උපකරණ වල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 40 | 40% |
| IV | ක්ෂේත්‍රයට අදාල උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 20 | |

**09.**සේවා කොන්දේසි

**(i)** පත්වීම ලබන නිලධාරියා රාජ්‍ය ප්‍රතිපත්ති වලටද ,රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග , කාර්ය පටිපාටික රීති ,ආයතන සංග්‍රහයේ විධිවිධාන , මුදල් රෙගුලාසි හා රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසි වලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වනු ඇත.

**(ii)** මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් එක් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ .

**(iii)** රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් දෙවන භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැදී වසර **05** ක් තුල ලබා ගත යුතුය.

**(iv)** දෙපාර්තමේන්තුව මඟින් නියම කරනු ලබන සේවා ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතුය.

**(v)** අයදුම්කරුවන් සිය අයදුම්පත්‍රය අදාළ අධ්‍යක්ෂවරයා මඟින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

**(vi)** නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්ද ,මූලික සුදුසුකම් සපුරා නැති අයදුම්පත්ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**(vii)** මෙහි සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් , ඒ සම්බන්ධව තීරණ ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

වෛද්‍ය නිහාල් වෙදසිංහ
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
දිනය -: **2018.08.16**
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. **13**, ගැටඹේ, පේරාදෙණිය.